**සීමාසහිත වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම - 2020**

**----------------------------------------------------------------------**

**1.1** **මතය**

**------**

**සීමාසහිත වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 මාර්තු 31දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (1)154ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018අංක 19දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී .පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබාගන්නා ලදී.**

**සමාගමේ 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.**

**1.2** **මතය සඳහා පදනම**

**------------------------**

**මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සඳහා විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කෙරේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.3** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**----------------------------------------------------------------------------------------**

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.**

**සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.**

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.**

## 1.4 විගණන විෂය පථය

-------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ  පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලවසමාගම කටයුතු කර ඇති බව,

- සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**2.** මූල්‍ය සමාලෝචනය
--------------------

**2.1** මූල්‍ය ප්‍රතිඵලය
-----------------

සමලෝචිත වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.**11,563,043,364** ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ලාභය රු.**12,103,450,641** ක් වූයෙන්, සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ රු.**540,407,277** ක අඩු වීමක් නිරීක්ෂණය විය.  මූල්‍ය පිරිවැය රු.**738,832,954** කින් වැඩිවීම මෙම මූල්‍ය ප්‍රතිඵලයේ අඩුවීමට ප්‍රධාන හේතුව විය.

**3.** මෙහෙයුම් සමාලෝචනය
--------------------------

**3.1** කළමනාකරණ ක්‍රියාකාරකම්
----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බලශක්ති උත්පාදනය පිළිබඳ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමට අනුව සමාගම විසින් නිකුත් කරනු ලබන මාසික ඉන්වොයිසි ලංකා විදුලිබල මණ්ඩලය විසින් සමාලෝචනය කරන ලද අතර බොහෝ අවස්ථාවන්හිදී ඉන්වොයිසියේ සඳහන් වටිනාකමට වඩා අඩු වටිනාකමක් විදුලිබල මණ්ඩලය විසින් පිළිගෙන තිබුණි. එකඟ වූ අගය ලංකා විදුලි බල මණ්ඩලය විසින් ස්ථිර කරනු ලබන අතර වෙනස සඳහා හේතු දැක්වීමක් සිදුකරනු නොලබයි. කෙසේ වෙතත්, මෙම වාර්තාවේ දිනය වන විටත් සමාගමට මෙම මතභේදයට විසඳුමක් ලබා ගැනීමට නොහැකි විය. | බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමේ අවශ්‍යතාවයට අනුකූලව ඇති වෙනස්කම් අපට දන්වන ලෙස ලිඛිතව ඉල්ලා සිටිමින් අපි ලංකා විදුලි බල මණ්ඩලය වෙත ලිපි කිහිපයක් යවා ඇති නමුත් මෙම ලිපි සඳහා ලංකා විදුලි බල මණ්ඩලය ප්‍රතිචාර දක්වා නොමැත. | මේ සම්බන්ධයෙන් විධිමත් ප්‍රතිපත්තියක් ස්ථාපිත කළ යුතුය. |

**3.2** මානව සම්පත් කළමනාකරණය
--------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන විධායක නිලධාරී, ගණකාධිකාරී සහ සහකාර ගණකාධිකාරී යන තනතුරු සඳහා මාණ්ඩලික නිලධාරීන් තිදෙනෙකු සමාගම විසින් පත්කර තිබුණ ද, සමාගම සඳහා බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයක් (SOR) සකස් කර නොතිබුණි. | කළමනාකරණයේ අදහස් දැක්වීම් ලැබී නොමැත. | සමාගම අංක පීඊඩී/12 දරන **2003** ජුනි **02** දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අංක පිඒඩී/12 දරන 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ සඳහන් පරිදි සමාගම විසින් සංයුක්ත සැලැස්මක් සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | කළමනාකරණයේ අදහස් දැක්වීම් ලැබී නොමැත. | සමාගම අංක පිඒඩී/12 දරන 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගම විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | කළමනාකරණයේ අදහස් දැක්වීම් ලැබී නොමැත. | සමාගම අංක පිඒඩී/12 දරන 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 4.3 විගණන කමිටු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා සමාගම විසින් විගණන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | කළමනාකරණයේ අදහස් දැක්වීම් ලැබී නොමැත. | සමාගම අංක පිඒඩී/12 දරන 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 4.4 අයවැයමය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අංක පිඒඩී/12 දරන 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සමාගම විසින් වාර්ෂික අයවැය ලේඛනයක් සකස් කර නොතිබුණි. | කළමනාකරණයේ අදහස් දැක්වීම් ලැබී නොමැත. | සමාගම අංක පිඒඩී/12 දරන 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**5.** **තිරසාර සංවර්ධනය**

--------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වන එක්සත් ජාතීන්ගේ "2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව සියළුම රාජ්‍ය ආයතන සිය විෂය පථයට අයත් අරමුණු සහ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කටයුතු කල යුතුව පවතී. එහෙත් සමාගම තිරසර සංවර්ධණ අරමුණු සම්බන්ධයෙන් දැනුවත්ව නොසිටි අතර ලඟාකර ගත යුතු ඉලක්කයන්, එම අරමුණු ලඟාකර ගැනීමේ දුර්වලතා සහ කාර්යසාධනය මැනීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගෙන නොතිබුණි.** | **කළමනාකරණයේ අදහස් දැක්වීම් ලැබී නොමැත.** | **තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වන එක්සත් ජාතීන්ගේ "2030 න්‍යාය පත්‍රයේ" විධිවිධානයන්ට අනුකූලව සමාගම කටයුතු කල යුතුය.** |